# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1898/27 - 2015 ජනවාරි මස 20 වැනි අඟහරුවාදා - 2015.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : DIK/LAN/02/30/40.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

***ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:***

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, වැවුරුකන්නල ග්‍රාම නිලධාරි වසමේ වලස්ගල ගමේ පිහිටි මාතර ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ අංක මූ. පී. මාර 2610 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස්

01. කැබලි අංක 01

ඉඩමේ නම: ගමරාලගෙ උස්වත්ත: ඉඩමේ විස්තරය: ගෙවත්ත, උළු සෙවිලි කරන ලද ස්ථිර ගොඩනැගිල්ලක් වැසිකිළිවලක් සහ තාවකාලික භෝග වගාවක්: හිමිකම් කියන අය: වලස්ගල, ගලෙන් ආර, ශ්‍රීකර පදිංචි පී. සමන්ති වගීෂා මුතුකුමාරණ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0397.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ළත් අයවලුන් හෝ 2015 පෙබරවාරි මස 11 වැනි දින පෙ.ව. 10.30ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2015 පෙබරවාරි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම්/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බී. එස්. රන්ජිත,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2015 ජනවාරි මස 20 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 64

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 20887 - 14 - (2015/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.